# ලාංකේය ජන විඥානයෙන් වියැකී යන ජන කවියේ ජෝඩු සීපද

ඩී.බී.එස්.පී කුලතුංග
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sandhyakulathunga@gmail.com

ශ්‍රී ලාංකේය පොදු ජන විඥානය සජීවී ලෙස හඳුනා ගතහැකි අංගයක් ලෙස ජනකවිය හැඳින්විය හැකිය. ඒ යටතේ සාකච්ඡා කරනු ලබන ජෝඩු සීපද හඳුනාගැනීමේදී එක් අයෙකු නගන පැනයට තවත් අයෙකු ලබාදෙන පිළිතුරු සමඟ මෙම සීපද බිහි වූ බව හඳුනාගත හැකිය. එයින් එකිනෙකා අතර පවතින අන්‍යෝන්‍ය බැඳීම, සුහදශීලී බව, දුක, සතුට, පාලුව, කාන්සිය මෙන්ම ඔවුන් සතු දක්ෂතාව, දැනුම පිළිබඳව ද මොනවට පැහැදිලි වේ.වයස් භේදයකින් තොරව රසවිඳිය හැකි ජනකවි විශේෂයක් ලෙස හඳුනාගත හැකි ජෝඩු සීපද වර්තමානය වනවිට අප අතරින් ගිලිහී යන තත්ත්වයට පත්ව ඇත.නමුත් සාම්ප්‍රදායික චින්තනය ගරු කරන ඇතැම් උගත්තු තම තමන්ට හැකි පමණින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ජනකවි ආරක්ෂා කිරීමට වෑයම් දරති.
ජනකවිය පිළිබඳ අධ්‍යයනයේදී, එය සමාජයේ සුලමුල දක්වන වාර්තාවක් බවත් ඒ වාර්තාවේ අත්හළ නොහැකි අංගය ජනකවිය බවත් පී.ඩී.එස්.වීරසූරිය මහතා හඳුන්වා දී ඇති අතර එමඟින්ද පැහැදිලි වන්නේ තත්කාලීන සමාජ තොරතුරු හෙළි කරගත හැකි අංගයක් ලෙස ජනකවිය වැදගත් බවයි. එකල සමාජයේ කාන්තාව පිළිබඳ, ඇයගේ යුතුකම් හා වගකීම් මෙන්ම ආරක්ෂාව පතා තහංචි පැනවීම්, තම අදහස් ඍජුව ප්‍රකාශ කිරීම ආදී දෑ පිළිබඳව ජෝඩු සීපද අධ්‍යයනයේදී අවධානය යොමු කළ හැකිය. මෙම පර්යේෂණයේදී ලිඛිත මූලාශ්‍ර සඳහා පුස්තකාල අධ්‍යයනය කළ අතර එහිදී ජනකවි පිළිබඳව ලියවුණු පොතපත පරිශීලනය කොට ජෝඩු සීපද මොනවාදැයි හඳුනාගැනීමත්, සම්මුඛ සාකච්ඡා වලදී තවදුරටත් ජනකවි හා ජෝඩු සීපද පිළිබඳ අධ්‍යයනයත් සිදුකරනලදී.
මෙම පර්යේෂණය සඳහා ශ්‍රී ලංකාවේ දැනට ශේෂව පවතින ජනකවි හා වියැකී යන ජෝඩු සීපද පිළිබඳ අධ්‍යයනය කිරීම සිදුකරන ලදි. එහිදී පර්යේෂණයේ පහසුව සඳහා දැනට මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල ගබඩාකර ඇති ජනකවි අධ්‍යයනය කිරීමත්, ඒ අතරින් ජෝඩු සීපද මොනවාදැයි හඳුනාගැනීමත්, ජනකවි පිළිබඳ සාම්ප්‍රදායික ඥානයක් සහිත පිරිස සමඟ සාකච්ඡා කිරීමත්, ඒ ජනකවි අතරින් දැනට ශේෂව පවතින ජෝඩු සීපද මොනවාදැයි විමර්ශනය කිරීමටත් මූලික අවධානය යොමු කරන ලදී. තවද මෙම ජනකවි වියැකී යාමට හේතු, වියැකී ගිය ජෝඩු සීපද ඉදිරියට පවත්වාගෙන යාමට පිළියම් හා ඒවා සංරක්ෂණය කළ යුත්තේ කෙසේද? යන්න පිළිබඳව අවධානය යොමු කිරීමට හැකිවිය.
පර්යේෂණය මඟින් ශ්‍රී ලංකාව තුළ ජනකවි අංගයක් වූ ජෝඩු සීපද වියැකී යාම නිසා ඉදිරි පරපුර වෙත සීපද රැකගෙන යාමට ඇති බාධා, ගැටලු හඳුනාගත හැකි විය.ඊට මූලිකම හේතුව වී ඇත්තේ මුඛ පරම්පරානුගතව පැවතුණු ජෝඩු සීපද පරම්පරාවෙන් පරම්පරාවට පැමිණෙන විට අඩු වැඩි වශයෙන් ඊට පද හා අදහස් එකතු වීමය. මීට පිළියමක් ලෙස මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යවල ගබඩා කිරීමේදී එය නිසි වගකීමකින් යුතුව සිදුකිරීම වඩාත් යෝග්‍ය යැයි සිතමි.

**ප්‍රමුඛ පද** :-ශ්‍රී ලංකාව; ජනකවිය; සීපද; සංරක්ෂණය; මුද්‍රිත මාධ්‍ය